# මුදල් අමාත්‍යාංශය
# நிதி அமைச்சு
# MINISTRY OF FINANCE

මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව. | செயலகம், கொழும்பு 01. இலங்கை | The Secretariat, Colombo 01. Sri Lanka

කාර්යාලය / அலுவலகம் / Office: (94)-11-2484500, (94)-11-2484600, (94)-11-2484700
ෆැක්ස් / பெக்ஸ் / Fax: (94)-11-2449823
වෙබ් අඩවිය / வெப் சைட் / Website: www.treasury.gov.lk

මගේ අංකය / எனது இல. / My No.: BD/CPB/4/1/9-2017
ඔබේ අංකය / உமது இல. / Your No.:
දිනය / திகதி / Date: 2016.12. 28


අයවැය චක්‍රලේඛ අංක: **05/2016**

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
සංස්ථා සභාපතිවරුන් සහ ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන්

## 2017 අයවැය - වියදම් දැරීම සඳහා බලය දීම සහ රාජ්‍ය වියදම් කළමනාකරණය

### (1) වියදම් දැරීමේ අධිකාරී බලය

2016.12.10 වන දින පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලද 2017 වර්ෂයට අදාළ වන 2016 අංක 24 දරන විසර්ජන පනතෙහි සඳහන් පරිදි වියදම් දැරීම සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 150(1) ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව මුදල් අමාත්‍යතුමා විසින් වොරන්ට් බලපත්‍ර අත්සන් තබා ඇත.

ඒ අනුව, ගෙවීම් වවුචර්පත් හා වෙනත් ලියවිලි මත පහත සඳහන් පරිදි අදාළ අධිකාරිය සටහන් කළයුතු වේ.

(අ) සාමාන්‍ය පොදු සේවා සඳහා - 2017 අංක 1 දරණ සාමාන්‍ය වොරන්ට් බලපත්‍රය
(ආ) විශේෂ නීති කටයුතු සඳහා - 2017 අංක 1 දරණ විශේෂ නීති අධිකාරී බලපත්‍රය
(ඇ) අත්තිකාරම් ගිණුම් කටයුතු සඳහා - 2017 අංක 1 දරණ අත්තිකාරම් බලපත්‍රය

### (2) රාජ්‍ය වියදම් කළමනාකරණය

රජයේ ආදායම් සීමාවන් සහ සාර්ව ආර්ථික ඉලක්කයන් තුළ වියදම් කළ හැකි සීමාවන් සලකා බලා 2017 අයවැය සකස් කර ඇත. එබැවින්, ලබාදී ඇති වියදම් සීමාවන් නොඉක්මවන පරිදි ස්වකීය ආයතනවල වියදම් කළමනාකරණය කරගැනීමට ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් හා ගණන්දීමේ නිලධාරීන් විසින් වර්ෂය මුල සිටම සැලසුම් කළ යුතුය. එසේම, ඒ පිළිබඳව නිරන්තරයෙන් සිය අවධානය යොමු කරමින් කටයුතු කළ යුතුය.

## 2.1 කාර්තුමය වියදම් සීමාවන්

සියළු ප්‍රධාන ගණන් දීමේ නිලධාරීන් හා ගණන් දීමේ නිලධාරීන් විසින් තම වැය ශීර්ෂ සඳහා කාර්තුමය වියදම් සීමාවන් නිශ්චය කර ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල් වෙත 2017.01.13 ට පෙර එවීමට කටයුතු කළ යුතු බවට උපදෙස් දෙනු ලැබේ.

## 2.2 2017 අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීම

2017 අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් අවශ්‍ය උපදෙස් ඒ ඒ අයවැය යෝජනාව සම්බන්ධයෙන් වගකීම් දරනු ලබන ආයතන වෙත වෙන් වෙන් වශයෙන් මේ වන විටත් දැනුම් දී ඇත.

2016 අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය පිළිබඳව සෑහීමකට පත්විය නොහැකි බැවින්, 2017 අයවැය යෝජනා සම්බන්ධයෙන් 2017 ජනවාරි මාසයේ මුල සිටම අවධානය යොමු කොට මුල් කාර්තුව තුලදීම ප්‍රසම්පාදන ක්‍රියාදාමයන් නිම කිරීමට අවශ්‍ය පියවර ගතයුතු බව අවධාරණය කරනු ලැබේ. එසේම, නියමිත කාලසීමාව තුල කාර්යයන් නිම කිරීමේ වගකීම නිශ්චිත නිලධාරීන් වෙත පැවරිය යුතුය. ආයතනයට අයත් සියළු අයවැය යෝජනා සම්බන්ධයෙන් සමාලෝචනය කිරීමත් මහා භාණ්ඩාගාරය හා අදාළ අනෙකුත් ආයතන සමඟ සම්බන්ධීකරණය කිරීමත් සඳහා අතිරේක ලේකම්වරයෙකු හෝ සමාන මට්ටමේ නිලධාරියෙකු නම් කර ඒ බව 2017 ජනවාරි මස 10 දිනට පෙර අයවැය දෙපාර්තමේන්තුව වෙත දැනුම් දිය යුතුය. ඉහත පරිදි කටයුතු සිදුවන බවට තහවුරු කරගැනීමේ වගකීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් ලෙස අමාත්‍යාංශ ලේකම්වරුන් වෙත පැවරෙනු ඇත.

2017 වර්ෂයේ අයවැය යෝජනා සම්බන්ධයෙන් වන ප්‍රතිපාදන 240-2-2 ව්‍යාපෘතිය (පරිපූරක සහාය සේවා සහ හදිසි අවශ්‍යතා වියදම්) යටතේ වෙන්කර ඇති අතර, වසර මුලදී එම ප්‍රතිපාදන අදාළ ආයතන වෙත නිදහස් කිරීමට කටයුතු කරනු ඇත.

## 2.3 අමතර ප්‍රතිපාදන

2017 වර්ෂය තුළ අයවැය සකස් කරන අවස්ථාවේදී අනුමැතිය ලබා නොගෙන හෝ අවධානය යොමු නොකරන ලද නව ව්‍යාපෘතීන්/නව වියදම් සඳහා අමතර ප්‍රතිපාදන ලබාදෙනු නොලැබේ. එවැනි ව්‍යාපෘති සඳහා නිසි අනුමත කර ගැනීමේ ක්‍රමවේදය අනුගමනය කර තිබේනම් මධ්‍යකාලීන අයවැය රාමුව ඇතුලත 2018-2020 තුළ ප්‍රතිපාදන සලසාදීමට ක්‍රියාකරනු ඇත.

## 2.4 බැඳීම් කළමනාකරණය

මුදල් රෙගුලාසි ප්‍රකාරව සෑම වියදමක් සඳහාම බැඳීම් ඇතිකර ගැනීමට පෙර ඒ සඳහා අවශ්‍ය මුල්‍ය ප්‍රතිපාදන පවතින බවට තහවුරු කරගත යුතු අතර, ප්‍රතිපාදන රහිතව ඇතිකර ගනු ලබන බැඳීම් සඳහා මහා භාණ්ඩාගාරය වගකීමට බැඳී නොසිටින බැවින්, අදාළ නිලධාරීන් විසින් ඒ සම්බන්ධයෙන් පුද්ගලිකව බැඳීමට යටත් වනු ඇත. එසේම, අළුතින් බැඳීම්වලට එළඹීමට පෙර පවත්නා බැඳීම් හා වගකීම් නිරවුල් කිරීමට අවශ්‍ය ප්‍රතිපාදන වෙන්කල යුතුය. ඒ අනුව, 2016 වර්ෂය අවසාන වනවිට නිරවුල් කිරීමට නොහැකි වූ බැඳීම් නිරවුල් කිරීම 2017 වර්ෂය තුළ නව බැඳීම් ඇතිකර ගැනීමට පෙර සිදුකල යුතුය.

(3) **අක්මුදල් ඉල්ලීම හා නිදහස් කිරීම**

මහා භාණ්ඩාගාරයේ මුදල් ප්‍රවාහ කළමනාකරණය සාර්ථක කරගත හැකිවන්නේ ඒ ඒ සතිය තුළ වැයවන සත්‍ය වියදම නිවැරදිව තක්සේරු කර දන්වා එවීමෙනි. ලැබීම් මුදල් ප්‍රමාණය ප්‍රමාණවත් නොවන අවස්ථාවලදී පමණක් වඩාත් ප්‍රමුඛ කාර්යයන් සඳහා වැඩි අවධානයක් යොමු කිරීමේ අරමුණ සහිතව අක්මුදල් නිදහස් කිරීමේ කටයුතු මනා සුපරීක්ෂණයකට ලක්කිරීමට අදහස් කර ඇත.

ඒ අනුව, සියළුම ආයතන විසින් අක්මුදල් ඉල්ලුම් කිරීමේදී එම ඉල්ලීම් ඒ සඳහා වන නියමිත ආකෘති පත්‍රයට අනුව එකිනෙක වැය විෂය යටතේ අවශ්‍ය වන මුදල වෙන වෙනම සඳහන් කිරීම කළයුතුය. එසේම, ප්‍රාග්ධන අයිතම සඳහා අක්මුදල් ඉල්ලීමේදී ඒ ඒ වැය විෂය යටතේ ගෙවීම් කිරීමට නියමිත කාරණය කුමක්ද යන්න විස්තර සහිතව දැක්විය යුතුය.

(4) **කාර්ය මණ්ඩල කළමනාකරණය**

2017 අයවැය කැඳවීම සඳහා වූ ජාතික අයවැය චක්‍රලේඛ අංක 2/2016 හි 3 (ආ) අනුව ආයතනවල කාර්ය මණ්ඩලය සම්බන්ධයෙන් නිසි වැඩ ඇගයීමක් සිදුකරන ලෙස දන්වා ඇත. නමුත් බොහෝ ආයතන විසින් ඒ සඳහා ප්‍රමාණවත් අවධානයක් යොමු කර නොතිබූ බැවින් මේ සම්බන්ධයෙන් නැවතත් අවධානය යොමු කර ඔබ අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/ ආයතනයේ කාර්යභාරය පදනම් කරගෙන නිසි වැඩ ඇගයීමක් සිදුකර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධවී ආයතනයේ කාර්ය මණ්ඩල අවශ්‍යතාවය නිවැරදිව හඳුනා ගැනීමට කටයුතු කළ යුතුය.

(5) **අත්තිකාරම් ගිණුම් කටයුතු**

අත්තිකාරම් ගිණුම් කටයුතු පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලද සීමාවන් තුළ කළමනාකරණය කළ යුතුය.

(6) **පැහැදිලි කරගැනීම්**

මෙම චක්‍රලේඛය පිළිබඳව යම් පැහැදිලි කරගැනීමක් අවශ්‍ය වේ නම්, ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් (දුරකථන අංක 011-2484665) වෙතින් ලබාගත හැක.

**ආර්.එච්.එස්.සමරතුංග**
භාණ්ඩාගාර ලේකම්

පිටපත් :

01. ජනාධිපති ලේකම්
02. අග්‍රාමාත්‍ය ලේකම්
03. අමාත්‍ය මණ්ඩලයේ ලේකම්
04. විගණකාධිපති